# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2122/42 - 2019 මැයි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2019.05.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙහි I උපලේඛනයේ දක්වා ඇති දැනටමත් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය හැර II වන උපලේඛනයේ I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම ලේඛනයේ II වැනි තීරුවෙහි තදානුරූපිව මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූද ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, එම ප්‍රදේශය එම වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

තවද, මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති දැනටමත් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශය සහ II වන උපලේඛනයේ II වැනි තීරුවේ දක්වා ඇති ප්‍රදේශයද ඇතුළුව සමස්ථ ප්‍රදේශය පුළුල් කරන ලද රිදීගම නාගරික සංවර්ධන බල ප්‍රදේශය ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

පාඨලී චම්පික රණවක (පා.ම.),
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 අප්‍රේල් මස 21 වැනි දින,
17 සහ 18 මහල්, ''සුහුරුපාය'',
ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**I වන උපලේඛනය**

| *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|
| 2008 දෙසැම්බර් මස 23 දින අංක 1581/11 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* | රිදීගම නාගරික සංවර්ධන බල ප්‍රදේශය |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## II වන උපලේඛනය

### වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම නාගරික සංවර්ධන ප්‍රදේශය ප්‍රකාශයට පත්කිරීම

*I වන තීරුව*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටියා වූ පහත සඳහන් අංක 529 පරගස්වැව, අංක 528 අඳපොල, අංක 530 දොඩම්ගහකොටුව, අංක 531 කොස්වත්ත, අංක 533 වැගම, අංක 552 ගොපල්ලව, අංක 551 රත්විට, අංක 546 බලවත්තල, අංක 555 කොතලාවලගම, අංක 549 දොඩම්ගස්ලන්ද, අංක 553 ලිහිණිවැහැර, අංක 557 රිදීගම, අංක 556 මඩිතියාව, අංක 545 තෙලඹුගල්ල, අංක 560 රැද්දගොඩ, අංක 571 ජන්තුරේ, අංක 603 රම්බඩගල්ල, අංක 604 නහල්ල, අංක 605 ඔලගම, අංක 608 මොරතිහ, අංක 615 දොරනෑපොල, අංක 614 හුනුපොලගෙදර, අංක 612 කුතුරුමහන, අංක 611 දැදුරුනදීගම, අංක 616 කරඳගොල්ල, අංක 617 අඹකොටේ, අංක 622 හැවැන්පොල, අංක 610 කවිසිගමුව, අංක 607 හුණුගල්කඩුල්ල, අංක 559 වරකාවැහැර, අංක 606 රඹුකන්දන, අංක 558 වැවගෙදර, අංක 554 නුවර යාය ග්‍රාම නිලධාරී කොට්ඨාස වලින් සමන්විත වූ II වන තීරුවේ විස්තර වන ඉම් සහ මායිම් වලින් යුක්ත වූ මුළු මහත් ප්‍රදේශය.

*II වන තීරුව*

*උතුරට :*

රිදීගම ප්‍රාදේශීය සභාවේ බස්නාහිර මායිම අංක 552 ගොපල්ලව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බස්නාහිර මායිම ඡේදනය වන ආරම්භක ලක්ෂයේ සිට උතුරු දිශානුගතව ඇඳී රේඛාව අංක 552 ගොපල්ලව ග්‍රාම නිලධාරී කොට්ඨසයේ බටහිර සහ උතුරු මායිම් ඔස්සේ නැගෙනහිර දිශානුගතව ගමන් කර අංක 533 වේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සහ අංක 531 කොස්වත්ත, අංක 530 දොඩම්ගහකොටුව, අංක 529 පරගස්වැව යන ග්‍රාම නිලධාරී කොට්ඨාස වල බටහිර මායිම් ඔස්සේ උතුරු දෙසට ගමන් කර එතැන් සිට එකී අංක 529 පරගස්වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර සහ උතුරු මායිම් ඔස්සේ අංක 528 අඹපොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර සහ උතුරු මායිම් ඔස්සේ අංක 527 උඩකඳවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර සහ දකුණු මායිම් ඔස්සේ දකුණු සහ නැගෙනහිර දිශානුගතව ගමන් කර අංක 535 උඩහේන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම හමුවන ලක්ෂයක් දක්වා අඳින ලද රේඛාවෙන් ද,

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට අංක 535 උඩහේන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ දකුණු දිශානුගතව අඳින ලද රේඛාව අංක 550 මීපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර සහ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ බටහිර දිශානුගතව ගමන් කර අංක 532 කණුගොල්ල ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු සහ බටහිර මායිම් ඔස්සේ වයඹ, බටහිර සහ දකුණු දිශානුගතව ගමන් කර අංක 538 පහල උඩත්තපොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු සහ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර සහ දකුණු මායිම ඔස්සේ දකුණු සහ ගිණිකොන දිශානුගතව ගමන් කර අංක 537 ඉහල උඩත්තපොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර සහ දකුණු මායිම් හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ අංක 536 මිහිරන්ගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ ගිණිකොන දිශානුගතව ගමන් කර අංක 547 අළකොළමඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර සහ උතුරු මායිම් හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ දකුණු දිශානුගතව ගමන් කර අංක 548, කොරොස්ස ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම ඔස්සේ අංක 562 ගිනිහිරිය ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව එකී ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම ඔස්සේ බටහිර දිශානුගතව ගමන් කර අංක 561 පල්ලේහොරාම්බුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු සහ නැගෙනහිර මායිම් හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු හා බටහිර මායිම ඔස්සේ දකුණු සහ ගිණිකොන දිශානුගතව ගමන් කර අංක 565

**II** උපලේඛනය *(සම්බන්ධිතයි)*

| *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|
| | *නැගෙනහිරට : (සම්බන්ධිතයි)*<br><br>උඩහොරෙම්බුව ග්‍රාම නිලධාරී වසමේ බටහිර සහ උතුර මායිම හමුවන ලක්ෂය දක්වා ද එතැන් සිට එම රේඛාව එකී ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම ඔස්සේ දකුණු දිශානුගතව ගමන් කර අංක 570 කිතුල්වල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වාද,<br><br>*දකුණට :*<br><br>අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට අංක 570 කිතුල්වල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු සහ බටහිර මායිම් ඔස්සේ බටහිර සහ දකුණු දිශානුගතව අඳින ලද රේඛාව අංක 593 වැලිකන්ද ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු සහ නැගෙනහිර මායිම් හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ නිරිත දෙසට ගමන් කර අංක 598 හලියමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු සහ නැගෙනහිර මායිම් හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සහ අංක 599 කන්දේගෙදර, අංක 609 ගබඩාගම, අංක 613 කන්දේපොල අංක 619 කොස්ගොල්ලේපොල ග්‍රාම නිලධාරී කොට්ඨාසවල උතුරු මායිම් ඔස්සේ බටහිර දිශානුගතව ගමන් කර අංක 619 කොස්ගොල්ලේපොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර සහ දකුණු මායිම් ඔස්සේ දකුණු සහ නැගෙනහිර දිශානුගතව ගමන් කර අංක 618 බුළුවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර සහ උතුරු මායිම් හමුවන තෙක්ද අඳින ලද රේඛාව එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ දකුණු දිශානුගතව ගමන් කර අංක 623 පල්ලි ඇල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ බටහිර දිශානුගතව ගමන්කර අංක 624 අක්කරපහ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම් හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ වයඹ දිශානුගතව ගමන් කර අංක 626 කෝන්ගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව එම මායිම ඔස්සේ වයඹ දිශානුගතව ගමන් කර රිදීගම ප්‍රාදේශීය සභා මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම රේඛාව රිදීගම ප්‍රාදේශීය සභා මායිම ඔස්සේ වයඹ දෙසට ගමන් කර කුරුණෑගල - කැප්පිටිගල මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂය දක්වාද,<br><br>*බටහිරට :*<br><br>අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට, රිදීගම ප්‍රාදේශීය සභා මායිම් රේඛාව ඔස්සේ උතුරු, ගිණිකොන, ඊසාන සහ නැවත ඊසාන දිශානුගතව අඳින ලද රේඛාව තල්ගොඩපිටිය - මාතලේ ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරමින් ආරම්භක ලක්ෂය හමුවන තෙක් අඳින ලද රේඛාවෙන් වටවූ ප්‍රදේශය. |

05 - 586

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.